


# සමනලයාව බේරගත්ත මී මැස්සා

ලිතුලි එහස්නා කරුණාරත්න

# සමනලයාව බේරගත්ත
# මී මැස්සා

ලිතුලි එහස්නා කරුණාරත්න

සමනලයාව බේරගත්ත මී මැස්සා

කෘතිය එලිදක්වන දිනය : 2023.11.15

ISBN 978-624-206-952-4

**ලිතුලි එහස්නා කරුණාරත්න**

***2* ශ්‍රේණිය *A***

**මහ/මහාමායා බාලිකා විද්‍යාලය,**

**මහනුවර.**

# පිදුම

මට සැමදාම මට දිරියක් වූ
මගේ අම්මාට අප්පචීටත්
මහාමාය බාලිකා විද්‍යාලයේ

මාගේ පංතිභාර ගුරු මෑණියන් වන
මංජුලා ප්‍රියංලිකා සුමණසිංහ ගුරු මෑණියන්ට

හා මට මෙම අවස්ථාව ලබාදුන්

මහාමාය විදුහල් මෑණියන්ට
මගේ මේ පුංචි වෑයම
පුදමි.


# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදූහල්පතිනිය,**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
2023.11.15



එකමත් එක කාලෙක සමනලයෙකුයි
මීමැස්සෙකුයි හිටියා.


සමනලයා ටිකක් කම්මැළියි. හැබැයි මී මැස්සා
නං හරිම කඩිසරයි. ටිකක්වත් කම්මැළි නෑ.



දවසක් සමනලයා හා මී මැස්සා දෙන්නම පැණි හොයන්න ගියා.

එකම රෝස මලෙන් පැණි ගන්න දෙන්නා පොර කැවා. ඒ නිසා දෙන්නා තරහා වුණා. ඊට පස්සේ දෙන්නා රෝස මල් දෙකකට ගිහිල්ලා පැණි ගත්තා.


ඊට පස්සේ පැණි ඇරගත්ත මී මැස්සා යන්න ගියා.




සමනලයාත් බඩ පිරෙන්න පැණි බීවා. බඩ පිරෙන්න පැණි බීලා යන්න ගියා.

සමනලයාගේ බඩ පිරිලා නිසා පියාඹන්නත් බෑ.
සමනලයා එතන තිබුණු මකුළු දැලක පැටළුණා.

එයා ගොඩාක් දැඟලුවා. එයාට බේරෙන්න බැරි වුණා.



සමනලයා තව තවත් මකුළු දැලේ පැටළුණා.
හොඳටම බය වෙලා  කෑ ගැහුවා.



"අනේ මාව බේරගන්න කෝ....."




ඒ සද්දේ එතනින් ගියපු මී මැස්සාටත් ඇහුණා.

මී මැස්සා එතකොට දැක්කා සමනලයා මකුළු දැලේ පැටලිලා ඉන්නවා.

"මගේ යාළුවේ ඔයාට කරදරයක් නේද......"
මී මැස්සා ඇහුවා.

"ඉන්න මම ඔයාව බේරාගන්න....."මී මැස්සා කිව්වා. ...

සමනලයා මකුළු දැලෙන් බේරාගත්තා.




"බොහොම ස්තූතියි....."

"මී මැස්සා ඔයා නැත්නම් මම අද ඉවරයි....."


"ඔයාට බොහොම ස්තූතියි මාව බේරත්තට....."

සමනලයා කිව්වා.



හොඳම යාළුවෝ කියන්නේ කරදරේ දී පිහිට වෙන අයටයි" මී මැස්සා කිව්වා.

අපි අද ඉඳන් හොඳම යාළුවෝ වෙමු" සමනලයා කිව්වා.





"ඔයයි  මායි එකතුවෙලා මීට පස්සේ පැණි හොයමු...."

දෙන්නා හැමදාම සතුටින් මල් පැණි හොයන්න ගියා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචිගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 15